**ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලය පිළිබඳ විගණකාධිපති වාර්තාව 2016 වර්ෂය**

ශීර්ෂය 279 - කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2017 ජූනි 22 දින දිස්ත්‍රික් ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම හා පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම**

**(අ) මුළු ප්‍රතිපාදනය හා වියදම**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.මිලියන 832.00 ක් වූ අතර, සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 779.82 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් රු.මිලියන 52.18 ක් හෙවත් සියයට 6.27 ක ප්‍රතිපාදන ඉතිරි වී තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදම | 2016 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | |
| පුනරාවර්තන | 636.00 | 624.35 | 11.65 | 1.83 |
| මූලධන | 196.00 | 155.47 | 40.53 | 20.68 |
| **එකතුව** | **832.00** | **779.82** | **52.18** | **6.27** |

(ආ) **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත අමාත්‍යාංශ 27 ක් හා දෙපාර්තමේන්තු17 ක් විසින් එකතුව රු.මිලියන 2,069 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන 1,812 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ලබා දී තිබුණු ප්‍රතිපාදනවලින් රු.මිලියන 257 ක් හෙවත් සියයට 12 ක ප්‍රතිපාදන ඉතිරි කර තිබුණි.

## 2.2 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අදාළ විෂය අංක 27901 යටතේ රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ .

| **වියදම** | | **ලැබීම්** | | **හර ශේෂය** | |
|---|---|---|---|---|---|
| **උපරිම සීමාව** | **තථ්‍ය** | **අවම සීමාව** | **තථ්‍ය** | **උපරිම සීමාව** | **තථ්‍ය** |
| රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| 42.00 | 41.74 | 32.00 | 39.96 | 145.00 | 136.48 |

## 2.3 පොදු තැන්පත් ගිණුම්

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය යටතේ වන තැන්පත් ගිණුම් 4 ක 2016 දෙසැම්බර් 31 දිනට ශේෂවල එකතුව රු.මිලියන 522.95 ක් විය. විස්තර පහත දැක්වේ.

| **තැන්පත් ගිණුම් අංකය** | **2016 දෙසැම්බර් 31 දිනට ශේෂය** |
|---|---|
| | **රු.මිලියන** |
| 6000/0000/00/0002/0067/000 | 24.93 |
| 6000/0000/00/0013/0037/000 | 76.64 |
| 6000/0000/00/0017/0004/000 | 37.40 |
| 6000/0000/00/0016/0019/000 | 383.98 |
| **එකතුව** | **522.95** |

## 2.4 විගණන නිරීක්ෂණය

කෑගල්ල දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ඉහත 1.1 ඡේදයේ දක්වා ඇති කළමනාකරණ විගණන වාර්තාවේ සඳහන් විගණන නිරීක්ෂණවලට යටත්ව සතුටුදායක ලෙස පිළියෙල කර තිබුණි. එම කළමනාකරණ විගණන වාර්තාවේ ඇතුළත් විගණන නිරීක්ෂණවලින් ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ 3 ඡේදයේ සඳහන් කර ඇත.

**3.** **ප්‍රමාණාත්මක හා වැදගත් විගණන නිරීක්ෂණ**

**3.1** **විසර්ජන ගිණුම**

**අයවැය විචලනය**

වැය විෂයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11.9 ක සිට සියයට 35.5 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.2** **වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය කිරීම**

සමාලෝචිත වර්ෂයේ අමාත්‍යාංශ 12 කින් සහ දෙපාර්තමේන්තු 10 කින් විවිධ කාර්යයන් සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය වෙත ලබා දී තිබුණු ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 11 ක සිට සියයට 67 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**3.3** **රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

විෂය අංක 27901 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ 2016 දෙසැම්බර් 31 දිනට වූ සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු.433,613 ක් වූ අතර, එම හිඟහිටි ණය ශේෂ වර්ෂ 4 ක පමණ කාලයක සිට පැවත එමින් තිබුණත්, එම ණය ශේෂ අයකර ගැනිමට දිස්ත්‍රික් ලේකම් කාර්යාලය අපොහොසත් වී තිබුණි.

**3.4** **යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

**3.4.1** **වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම**

2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**3.4.2** **වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පිළියෙල කර නොතිබුණි.

**3.4.3** **වාර්ෂික කාර්යසාධන වාර්තාව**

2002 සැප්තැම්බර් 12 දිනැති අංක 402 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් මුදල් වර්ෂය අවසාන වී දින 150 ක් ඇතුළත කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවත්, සමාලෝචිත වර්ෂය සඳහා වූ එම වාර්තාව 2017ජුනි 23 දින වන විටත් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි.

## 3.5 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| | රු. | |
| **(අ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය** | | |
| XIX පරිච්ඡේදයේ 1.1 හා 6.2 උපවගන්තිය | 160,776 | යම්කිසි තනතුරකට හෝ ශ්‍රේණියකට වෙන්කරන ලද උපලේඛණගත නිවාස එම තනතුරේ සේවය කරන නිලධාරින් වෙනුවෙන් වෙන්කළ යුතු වුවද, 2000 වර්ෂයේදී වෙනත් බාහිර පාර්ශවයක් වෙත ලබා දී තිබුණු කෑගල්ල අතිරේක දිස්ත්‍රික් ලේකම් නිල නිවස 2017 ජූනි 16 දින ආපසු නියමිත නිලධාරියා වෙත ලබා දීමට කටයුතු කර තිබුණි. නමුත් 2017 මැයි මාසය දක්වා එම රජයේ නිවාසය වෙනුවෙන් අය කළ යුතු නිවාස කුලිය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | |
| මුදල් රෙගුලාසි 703(2)(ආ) | 1,267,157 | මුදල් රෙගුලාසියට පටහැනිව කිවුල්දෙණිය එකමුතුගම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය අතුරු කොන්ත්‍රාත් දී ඉටු කර ගෙන තිබුණි. |

(ඇ) **අයවැය චක්‍රලේඛය**

**--------------------**

| | | |
|---|---|---|
| 2016 ජනවාරි 06 දිනැති අංක BD/GPS/130/9/14 mc-III දරන ලිපිය | 2,512,260 | ක්ෂේත්‍ර නිලධාරියෙකු යතුරුපැදි හිමිකම් නොලබන තනතුරකට පත්වී යාමේදී, සේවයෙන් ඉවත්වීමේදී, සේවය අත්හිටුවීමකදී හා නියමිත කාලයට පෙර විශ්‍රාම යාමේදී ඔහු වෙත ලබා දී ඇති යතුරු පැදිය සඳහා එහි වෙළඳපල වටිනාකම අයකර ගත යුතු වුවත්, ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක නිලධාරීන් 18 දෙනෙකු සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි. |

**3.6 දේශීය මුල්‍යකරණ මගින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම**

**-----------------------------------------------------------**

ව්‍යාපෘති ආරම්භ නොකර අත්හැර දැමීම්, ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම් හා ව්‍යාපෘති ප්‍රමාදයන් පිළිබඳව විගණන නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ අවස්ථා පහත දැක්වේ.

**ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම්**

**-------------------------------------**

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ගොඩනැගිල්ල රු.294,982,342 ක ඇස්තමේන්තු පිරිවැයකට ඉදිකිරීම් කටයුතු 2011 වර්ෂයේදී ආරම්භ කර 2014 මැයි 10 දින වන විට අවසන් කිරීමට සැලැසුම් කර තිබුණි. ඒ වෙනුවෙන් 2016 දෙසැම්බර් 31 දින වන විට රු.77,119,833 ක් වැය කර තිබුණි. ඉදිකිරීම් කටයුතු වලින් සියයට 10 ක් වැඩ කොටසක් පමණක් ඉටු කර තිබුණු අතර කොන්ත්‍රාත්කරු විසින් ඉදිකිරීම් කටයුතු අතර මග නවතා තිබුණි. මෙම ගොඩනැගිල්ලේ බිම් මහල මැදින් පුපුරා තිබුණු අතර ගොඩනැගිල්ලේ ඉදිරිපස හා පිටුපස තරප්පු පේළි සඳහා බඳින ලද මුළු කම්බි ප්‍රමාණයම දිරාපත් වී තිබුණි.

**3.7 කාර්ය සාධනය**

**----------------**

**ප්‍රමාණවත් ලෙස ඉටු නොකළ ප්‍රධාන කාර්යයන්**

**------------------------------------------------**

2016 ඔක්තෝබර් මාසයේදී කෑගල්ල දිස්ත්‍රික්කයේ ආපදා හේතුවෙන් හානියට පත්වූ සබරගමුව පළාත් සභාවේ මාර්ග 37 ක් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා පරිපූරක ඇස්තමේන්තු වෙන්කිරීමක් මගින් රු.මිලියන 100 ක ප්‍රතිපාදන ලබා ගෙන තිබුණි. එම ප්‍රතිපාදනවලින් ඇස්තමේන්තු කර තිබුණු රු.20,715,000 ක් වූ මාර්ග 7 ක ඉදිකිරීම් කටයුතු මිල ගණන් නොලැබීම නිසා ඉටු කර නොතිබුණි. ඇස්තමේන්තු වටිනාකම රු.33,493,305 ක් වූ තවත් මාර්ග 11 ක ඉදිකිරීම් කටයුතු ඉටු කිරීම සඳහා කාලය ප්‍රමාණවත් නොවීම නිසා 2017 වර්ෂයට අවිච්ඡේද කර තිබුණි.

## 3.8 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණවලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) වරකාපොල ප්‍රාදේශීය සභාවවෙත පවරා දී තිබූ කිවුල්දෙණිය එකමුතුගම ක්‍රීඩා පිටිය සංවර්ධනය කිරීමේ කර්මාන්තය ඉටුකිරීම සඳහා එම සභාව විසින් කිවුල්දෙණිය ග්‍රාමීය සමෘද්ධි සමිතිය සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. එම කර්මාන්තය යෝජනා කිරීමට පෙර ශක්‍යතා අධ්‍යනයක් කර නොතිබුණි. විගණන දින වූ 2017 පෙබරවාරි 09 දින වන විට ව්‍යාපෘතිය සම්පූර්ණයෙන් ඉටුකළ ලෙස සලකා රු.1,267,157 ක් ගෙවා තිබුණත්, ක්‍රීඩා කිරීමට හැකි වන සේ ක්‍රීඩා පිටිය සකස් කර නොතිබුණි. මෙම කර්මාන්තය ඉටු කිරීමේ දී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

(i) ගිවිසුමේ 07 වන වගන්තිය ප්‍රකාරව තෙවන පාර්ශවයන්ට අයත් දේපලවලට සිදුවන අලාභ යථා තත්ත්වයට පත්කළ යුතු වුවත්, මෙම ඉදිකිරීම් හේතුවෙන් වැසී ගිය පානීය ජලය ලබාගන්නා ළිඳ හා ඇල මාර්ගය යථා තත්ත්වයට පත්කර නොතිබුණි.

(ii) කර්මාන්තයේ වැඩ විෂයයන් 04 කට අදාළ වැඩ නියමිත ප්‍රමාණයට වඩා රු.384,344 ක් අඩුවෙන්ද, එක් වැඩ විෂයකට අදාළ රු.18,060 ක් වූ වැඩ සම්පූර්ණයෙන්ද නිමකර නොතිබූ අතර, තවත් වැඩ විෂයයන් 2 කට අදාළ වැඩ අනුමත ප්‍රමාණයට වඩා වැඩියෙන් ඉටු කර තිබීම නිසා රු.737,850 ක් වැඩියෙන් ගෙවා තිබුණි.

(iii) ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිසම් සභාවට අයත් ඉඩමකින් ක්‍රීඩාපිටිය පිරවීම සඳහා පස් ලබාගෙන තිබුණද, ඒ සඳහා ලිඛිත අවසරයක් ලබාගෙන නොතිබුණි.

(iv) වැඩ විෂය අංක 06 යටතේ මාර්ග ඉදිකිරීම් සම්බන්ධයෙන් වූ සම්මත නියමයන්(HSR) සපුරා නොතිබියදී පස් සපයා ප්‍රවාහනය වෙනුවෙන් කියුබ් 1 කට රු.3,000 ක් බැගින් පස් කියුබ් 364 ක් සඳහා රු.1,092,000 ක් ගෙවා තිබුණි.

(v) ක්‍රීඩාපිටිය සඳහා පිරවීමට අවශ්‍ය පස් ප්‍රමාණය කියුබ් 120 ක් ලෙස ඇස්තමේන්තු කර තිබූ අතර අවසාන බිල්පත සැකසීමේදි යෙද වූ පස් ප්‍රමාණය කියුබ් 364 ක් ලෙස දක්වා බිල්පත සකස් කර තිබුණි. තවද සපයන ලද පස් ප්‍රමාණය පිළිබඳව වගකිව යුතු නිලධාරියෙකු විසින් සහතික කරන ලද මිනුම් වාර්තා විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි.

(vi) ක්‍රිඩාපිටියේ අඩි 140 ක් දිගින් යුත් පැති බැම්මක් ඉදිකිරීම සඳහා ඇස්තමේන්තු කර තිබුණද, එය අඩි 76 ක් දක්වා අඩු කර ඉදි කර තිබුණි.

(ආ) දැරණියගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ අවතැන්වූවන් පදිංචි කරවීම සඳහා තෝරාගන්නා ලද මලන්දෙණිය ඉඩමට පිවිසුම් මාර්ග හා එහි අභ්‍යන්තර මාර්ග ඉදිකිරිම සඳහා ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් මාර්ග කියුබික් මීටර් 1,146 ක දුර ප්‍රමාණයක් කැපීම හා කියුබික් මීටර් 37.57 ක ප්‍රමාණයක් මාර්ග කොන්ක්‍රීට් කිරීම සඳහා රු.779,393 ක ප්‍රතිපාදන ලබා දී තිබුණි. එම සියළු කටයුතු දින 6 ක් වැනි කෙටි කාල පරාසයක් තුළ ඉටු කිරීමට ගිවිසුමකට එළඹ තිබුණි. මාර්ගය අඩි 390 ක් පමණ දිගට කොන්ක්‍රීට් කර තිබුණි. එම මාර්ග භෞතික පරීක්ෂාවේදී කොන්ක්‍රීට් මිශ්‍රණය දුර්වල වී තිබුණු ස්ථානද, කොන්ක්‍රීට් තට්ටුවේ පැලීම් හා කැඩී යාම් ද හා ඉදිකරන ලද මාර්ග දෙපස ඇති උරහිස් පස් දමා පුරවා නොතිබුණු අවස්ථා ද නිරීක්ෂණය විය. මාර්ගය කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ ඇස්තමේන්තුව රු.558,671 කට පිළියෙල කර තිබුණි. කොන්ත්‍රාත්තුව රු.535,593 කට පිරිනමා තිබුණි. එහෙත් ගෙවීම් කිරීමේදී කොන්ත්‍රාත්තුවේ වටිනාකම රු.120,944 කින් ඉක්මවා කොන්ත්‍රාත්කරුට රු.656,537 ක් ද ගෙවා තිබුණි. තවද මාර්ගයේ

ආරම්භක කොටස දැඩි ආනතියකින් යුතුව සකස් කර තිබීමෙන් ජීවිත හා දේපලවලට අනතුරුදායක තත්ත්වයක් පවතින බවද නිරීක්ෂණය විය.

**3.9 අවිධිමත් ගනුදෙනු**

---------------------

දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(අ) දැරණියගල ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ ක්‍රීඩා අමාත්‍යාංශයේ ප්‍රතිපාදන යොදවා මියනවිට වත්ත ශක්ති ක්‍රීඩාංගනය සංවර්ධනය කිරිමට රු.418,034 ක් හා උඩබාගේ වත්ත ගාන්ධි නගර් ක්‍රිඩාංගනය සංවර්ධනය කිරීමට රු.395,660 ක් වැය කර තිබුණි. නමුත් මෙම ක්‍රීඩා පිටි ක්‍රීඩා කිරීමට හැකි වන සේ සකස් කර නොතිබීමෙන් ප්‍රතිපාදන ලබා දීමේ අරමුණ ඉටු කිරීමට නොහැකි වී තිබුණි.

(ආ) ආපදා කළමනාකරණ අමාත්‍යාංශය විසින් ලබා දෙන ලද ප්‍රතිපාදන යටතේ බකුල්වල පාසල අසල සිට අවතැන්වූවන් පදිංචි කිරීමේ ඉඩම දක්වා ප්‍රවේශ මාර්ගය ඉදිකිරීම සඳහා පෞද්ගලික කොන්ත්‍රාත් ආයතනයක් විසින් රු.මිලියන 6.1 කට ගිවිසුමකට එළඹ තිබුණි. අදාළ ඇස්තමේන්තුවේ රු.මිලියන 1 කට එකඟ වූ බිල් අංක 2 යටතේ වැඩ කොටස් ඉටුකර නොතිබුණු අතර වැඩ විෂයන් 20 ක් එකඟ වූ ප්‍රමාණයන්ට වඩා අඩුවෙන් ඉටුකර තිබුණි. එක් වැඩ විෂයක් ඇස්තමේන්තුවේ සඳහන් ප්‍රමාණයට වඩා ඉටුකිරීම හේතුවෙන් රු. 1,021,202 ක් වැඩියෙන් ගෙවා තිබුණි. තවද මෙම මාර්ගය ඉදිකිරීමේදී පාසලේ පානීය ජල ළිඳට යන මාර්ගය අවහිර වීම සහ තිබූ වැට ඉවත් කිරීම කර තිබුණද එය නැවත සකස් කර දීමට කොන්ත්‍රාත්කරු විසින් කටයුතු කර නොතිබුණි.

(ඇ) 2013 හා 2014 යන වර්ෂයන්හිදි දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ විදුලි අවශ්‍යතා පිරිමැසීමට රු.4,240,000 කට පෞද්ගලික සමාගමක් වෙතින් පැනල් 28 කින් හා පැනල් 30 කින් යුත් සූර්ය බලශක්ති පද්ධති දෙකක් සවිකර තිබුණද, එයින් එක් පද්ධතියකට අදාළ පැනල් 2 ක් සිදුකර නොතිබුණි. තවද එම පැනල් සවිකිරීමෙන් අපේක්ෂිත වූ විදුලිය පිරිමැසීමේ අරමුණ කරා ළගා වීමට නොහැකිවී තිබුණි.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

-----------------------------------

**අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව**

-----------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෝෂ්ඨ මට්ටම | 43 | 39 | 04 | - |
| (ii) | තෘතියික මට්ටම | 30 | 21 | 09 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1,048 | 974 | 75 | 01 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 118 | 104 | 26 | 12 |
| | **එකතුව** | **1,239** | **1,138** | **114** | **13** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) බුලත්කොහුපිටිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගණකාධිකාරී තනතුර 2014 සැප්තැම්බර් 01 දින සිටද, දැරණියගල, අරණායක හා රුවන්වැල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල භාෂා පරිවර්තක තනතුර 2014 වර්ෂයේ සිටද, දැරණියගල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පරිපාලන නිලධාරී තනතුර 2014 අප්‍රේල් 17 දින සිටද, පුරප්පාඩුව පැවතුණි. එම තත්ත්වය එකී කාර්යාලවල කාර්ය කටයුතුවලට සැලකිය යුතු ලෙස බලපා තිබුණද, එම පුරප්පාඩු පිරවීම සඳහා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) ප්‍රාථමික මට්ටමේ නිලධාරීන්ගේ උසස්කිරීම් පරිපාටි විධිමත් පරිදි සිදු නොකිරීම හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව වාහන සඳහා ගැලපෙන පරිදි අනුමත රියදුරු තනතුරු සංඛ්‍යාව සංශෝධන නොකිරීම නිසා රියදුරු 03 දෙනෙකු ඇතුළුව සේවකයන් 12 දෙනෙකුගේ අතිරික්තයක් පැවතුණි.